# තේ ඉස්ටෝරුව

සනත් පියසේන




ගාලබැදිහේන තේ ඉස්ටෝරුව මගේ සිත රැඳුණු තවත් ස්ථානයකි. අක්කරදහය, සොහොන කඩේ, විනී මහත්තයලාගේ ගෙදර පසු කොට වරකාගොඩ පැත්තට යන විට වම් අත පැත්තේ හමු වන කඩය ජයසිංහ මුදලාලිගේ ය. පැත්තක තේ කඩය තිබුණු අතර අනික් පැත්තේ සිල්ලර කඩය යි. එතැන ද රබර් මිලයට ගන්නා ස්ථානයකි. අවසරලත් රබර් වෙළඳ තැන යන දැන්වීම් පුවරුව බිත්තියේ එල්ලා ඇත. නිතරම රබර් ෂීට් කිහිපයක් වේලෙන්නට මිදුලේ වැළක වනා ඇත. දොර ලෑල්ලක් සහ බිත්තියකින් සෑදී ඇති මුල්ලක ඔට්ටුපාළු ගොඩකි. ජයසිංහ මුදලාලි කේන්ද්‍ර බැලීම සහ ලිවීම ආදී ජ්‍යොතිෂ කටයුතු වලට ඉතාමත් දක්ෂයෙකි. කේන්ද්‍ර ලිවීම පිණිස ප්‍රයෝජනයට ගන්නා පුස්කොළ තොගයක් තම්බා වියලීම සඳහා වැළක දමා ඇත. කේන්ද්‍ර කොටුවක් ද ඇඳ තිබුණු පුවරුවක කේන්ද්‍ර ලිවීම, බැලීම, පොරොන්දම් බැලීම ආදී කරුණු සඳහන් ව තිබුණි.

අප අක්කරඅවේ, අක්කරදහයේ හා වෙළේ රබර්ගස් යටින් ගලවා ගන්නා බිම්පාළු ගෙනැවිත් දෙන්නේ ජයසිංහ මුදලාලි ගේ කඩයට ය. බිම්පාළු යනු රබර් ගස් වලින් උතුරා ඉවතට යන රබර්කිරි බිමට වැටී මිදී ඇති ලඩය යි. මා දන්නා බොහෝ රබර් ගස්වලට උඩඅළු ගසා තිබුණි. උඩඅළු ගැසූ රබර්ගස් යට බිම්පාළු වැඩි ය. උඩඅළු ගැසීම යනු රබර් ගසේ ඉහළට කැපීම යි. සමහර විටක උඩඅළු ගසන කිරිපිඟිය අඩි අටක්, නවයක් පමණ දිග මිටකින් යුතු වේ. උඩඅළු ගැසීම පටන් ගන්නේ ගස් බොහෝ සෙයින් පරණ වූ විට ය. මනා හුරුවකින් කළ යුතු මෙම කාර්යයට සමහර විට, එක ගසකට විනාඩි දහයක පහළොවක තරමේ කාලයක් ගත වෙයි. සමහරක් ගස් වල අතු දිගේ පවා උඩඅළු ගසා තිබෙන අන්දම දැකිය හැකි ය.

අක්කරඅවේ තිබුණු විශාල රබර් ගසක සුවිශේෂත්වයක් පිළිබඳ ව මගේ මතකයේ ඇත. එම රබර්ගස ඉතාමත් විශාල ය. තවත් සුවිශාල ගස් බොහෝ තිබුණත්, මෙම ගස පිළිබඳ මතකයට විශේෂයෙන් හේතු වූයේ රබර් ගස කපා කිරි වෑහෙනු පිණිස වෙනත් ගස්වලට පොල්කටු තැබුවත් මෙම ගසට තබන්නේ තරමක පනිට්ටුවක් වීම ය. පනිට්ටුව උතුරන්න තරම් කිරි එම ගසින් වෑස්සෙයි.

බිම්පාළු ගලවා ගැනීමට අපි කිහිප දෙනෙකු ම පුරුදු ව සිටියෙමු. බිම්පාළු රාත්තලක් කඩයට ගන්නේ ශත තුනකට ය. එහෙත් ජයසිංහ මුදලාලි ගේ කඩයේ පමණක් රාත්තල් දෙකකට ශත හතක් දෙන නිසා වැඩි වශයෙන් අප පුරුදුව සිටියේ බිම්පාළු එම කඩයට ම ගෙන යාමට ය. ඊට තවත් විශේෂ හේතුවක් නම් නො සේදූ බිම්පාළු මිලයට ගන්නේ එම කඩය පමණක් වීම ය. අනෙකුත් සියලු ම කඩවලට බිම්පාළු සෝදා වියලා ගෙන යා යුතුව තිබිණි. ජයසිංහ මුදලාලි ගේ කඩයේ එකතු කරනු ලබන බිම්පාළු කඩය මගින් ම සෝදවනු ලැබේ. ගමේ කාට හෝ කියා ඒවා සෝදවයි. සෝදන ලද බිම්පාළුවලට තෙත පිටින් රාත්තලකට සතය බැගින් කුලිය වශයෙන් ගෙවීවේ ය. මම ද සත විසිපහක් තිගත් බිම්පාළු සේදීමේන් ලබා ගෙන ඇත්තෙමි. ජයසිංහ මුදලාලි ගේ කඩයේ රබර්ඇට මිල දී ගැනීම ද සිදුවිය. රබර් ඇට වැටෙන කාලයට අපි පාසල් කාලයෙන් පසු අක්කරඅටට. අක්කරදහයට, ටැම්පෝ වත්තට රබර්ඇට ඇහිලීම සඳහා යාමට පුරුදු ව සිටියෙමු. රබර්ඇට වැටෙන කාලයට රබර්වත්ත පුරාම ඇත්තේ රබර්ගෙඩි පුපුරණ නො නවතින ශබ්දය යි. එම ශබ්දය දවස පුරා ම ඇසේ. රබර්ගෙඩියක් පුපුරන ශබ්දය අනුව වත්ත පුරා දුව ඇවිදිමින් තරඟයට රබර්ඇට ඇහිලීම අපට විනෝදයක් මෙන් ම පොරට වැටීමට ද හේතුවක් විය. එක රබර් ඇටයකට දුවන පිරිස එක පොදියේ වැටෙන අවස්ථා ද නැතිවා නොවේ. රබර්ඇට දෙතුන් සියයක් අනුලා ගන්නා අපි ජයසිංහ මුදලාලිගේ කඩයට දුවන්නේ ද තරඟයට මෙනි. රබර්ඇට සියයකට ලැබෙන්නේ ශත පහකි. මෙම රබර් ඇටවලින් ටික ගැසීම ද අපගේ තවත් ක්‍රීඩාවකි. එසේ ම රබර්කටුව වශයෙන් අප හඳුන්වන, රබර් ගෙඩියේ ඇටය වසාගෙන ඇති පියන්පත් දෙකක් දෙපසට හිර කර ඇඟිලි දෙකෙන් අල්ලා බඹර පිඹීමද විනෝදයක් ගෙන දෙන්නක් විය.

ජෝන් මුදලාලි ගේ තේ ඉස්ටෝරුව පළාතේ බොහෝ පිරිසකට රැකියා සැපයූ ඉතාමත් වැදගත් ආයතනයක් ලෙස අද මට සිතා ගත හැකි ය. ජෝන් මුදලාලි විවාහකයෙක් නොවේ. ඔහු ජයසිංහ මුදලාලිගේ මෙන් ම වලියම් කට්ටඩි මහතාගේ ද සහෝදරයෙකි. නාහල්ල පන්සලේ වැඩවසන නිතරම මුවපුරා මතුවී ඇති සිනා රැළ්ලකට උරුම කම් ලැබූ කරන්නාගොඩ පේමානන්ද ස්වාමීන් වහන්සේ ද, ජෝන් මුදලාලිගේ සහෝදරයෙකි. ජෝන් මුදලාලි මහතා ඉතාමත් කරුණාවන්ත පුද්ගලයෙකි. ඔහු කමියයක් ඇඳ සිටිනවා මා කවදාවත් දැක නැත. සුදුපාට සරම ඇඳ ලොකු පොකැට්ටුවක් ඇති කළුපාට පටියක් ඉනේ බැඳ සිටියි. නිතර ම කරේ සුදු පාට සාළුවක් තිබේ.

ඉතාමත් වාම් නිගතමානී ජීවිතයක් ගත කළ කෙනෙකි. ජයසිංහ මුදලාලි මහතාගේ කඩයට අල්ලපු වත්තේ පිටිපස්සට වෙන්න තේ ඉස්ටෝරුව තිබුණි. මෙහි අතින් කරකවා තේ අඹරන මැෂිමක් විය.

එම ස්ථානයේ තිබූ තේ ඉස්ටෝරුව පසුව ගාලබැදිහේනේ ම ලොකු ගොඩනැගිල්ලක් සාදා එ තැන නිෂ්පාදන කටයුතු කෙරිණ. එය තට්ටු දෙකක ගොඩනැගිල්ලකි. බිත්ති ගඩොල් බැමිමෙන් බැඳ තිබුණි. ඉහළ මාලයේ තට්ටුව ලෑළි වලින් සාදා තිබුණි. වහලය ද ටකරන් ය. තේ ඉස්ටෝරුවේ බොහෝ මැෂින් සවිකොට තිබුණි. තේ අඹරන මැෂින් සහ තේ කුඩු එක එක ප්‍රමාණයෙන් යුතුව වෙන්වන මැෂිමක් මට මතක ය. එක එක

> *සමහර දාට මම, පියතිලක බාප්පා සමග තේ ඉස්ටෝරුව පැත්තේ යන්නෙමි. සොහොන කඩේ කම්මලේ යකඩ තළන සද්දය අක්කර දහයේ සිට තේ ඉස්ටෝරුවට යන තුරුම ඇසේ.*

ප්‍රමාණයෙන් යුතු සිදුරු සහිත සෘජුකෝණාස්‍රාකාර විශාල පෙනේර තිබුණි. ඒවා තට්ටු වශයෙන් හතරක් හෝ පහක් අඩි තුනක් පමණ පළලට, අඩි හයක් පමණ දිගට තිබුණා මතක ය. යන්ත්‍රානුසාරයෙන් සෙලවෙන මෙම මැෂිමේ දී එකින් එකට හැලි හැලි එන තේ කුඩු තේරී පහළ ම දාලෙන් හැලෙන්නේ ඉතා සියුම් කුඩු වශයෙනි.

තේ නැටි ඇහිලීම එක් අංශයකි. අඹරන ලද තේ කොළවල නැටි කැබලි අනුලා ඉවත් කිරීම ''තේ නැටි ඇහිලීම'' වශයෙන් නම් ලබා ඇත. පළාතේ බොහෝ ගැහැණු ළමයින් එම වැඩය සඳහා යොදා ගෙන තිබුණි. ඔවුන් පේළියට වාඩි වී ඉතාමත් කඩිසර ව තේනැටි ඇහිලීම තේදළු කඩනවා වාගේ ම ලස්සන දර්ශනයකි. පළාතේ බොහෝ කුඩා තේ වතු හිමියන් ගේ තේ, මානානේ තේ ඉස්ටෝරුවට ගෙනැවිත් දීම සිරිත ය. ජයසිංහ මුදලාලිගේ කඩයේ ද, උඩහ කඩේ ද, පහළ කඩයක ද තේ දළු එකතු කළ බවක් මතක ය. තේ දළු එකතුකිරීම සඳහා ලොරියක් කළුතර දිස්ත්‍රික්කය තුළ ඇති කුඩා හා මධ්‍යම තේ ඉඩම්වලට ගොස් දළු රැගෙන එන දර්ශනයද, තේ පෙට්ටි පටවාගෙන කොළඹට පිටත්වන දර්ශනයද අපට නිතර අසස ගැටේ. පසු කාලයකදී අපේ සයිමන් ආතා ද මෙම ලොරිවල රියැදුරා වශයෙන් වැඩ කළ බව මට මතක ය.

ගාලබැදිහේනේ තේ ඉස්ටෝරුවේ තේ ඉතාමත් ප්‍රතිත රසයෙන් යුතු තේ බව මා අත් විඳීමෙන් දැනගත්තේ සයිමන් ආතලාගේ තිවසින් බොන තේ කෝප්පයේ ඇති විශේෂිත රසය තුළිනි. සමහර දාට මම, පියතිලකබාප්පා සමග තේ ඉස්ටෝරුව පැත්තේ යන්නෙමි. සොහොන කඩේ කම්මලේ යකඩ තළන සද්දය අක්කරදහයේ සිට තේ ඉස්ටෝරුවට යන තුරුම ඇසේ. සමහරක් දාට පුවක්වතුගොඩේ යෝමතිස්ස ද අප සමග ගියා මට මතක ය. තේ ඉස්ටෝරුවේ මැෂින් වැඩ කරන හැටි බලන්නට අප හරි කැමති ය.

මැෂින් පෙළක් ම ක්‍රියාත්මක වුණේ එකම එන්ජිමකින් ය. එන්ජිම පණ ගන්වන හැටි දැක ගැනීමත් අපේ සතුටට හේතුවකි. එන්ජිම ක්‍රියා කරනු ලබන පුද්ගලයා අතට ගන්නා හැඩැලය එන්ජිමේ ඇති ලොකු රෝදයකට සවි කරයි. දෑත බදා හෙමින් හෙමින් කරකවන විට රෝදයේ වේගය ක්‍රමයෙන් වැඩි වී "බොස් බොස්" හඬින් ශබ්ද නගමින් එන්ජිම ධාවනය වීමට පටන් ගනී. එන්ජිමේ වේගය ආරම්භ වන විට ම වාගේ හැන්ඩ්ල් එක ඉවතට ඇද ගනී. එන්ජිමේ සිට කරකැවෙන දිග යකඩ කඳකි. එම කඳට සමාන්තර වන ලෙස තැනින් තැන මැෂින් සවි කොට තිබුණි. එක එක ආකාරයේ මැෂින් වැඩ කරන අයුරු විශේෂිත දෑසින් අපි බලා සිටින්නෙමු.

සමහරක් දාට ජෝන් මුදලාලි අප සිටින දෙසට පැමිණ අපට හීන් සිනාවක් පායි. ඔහුගේ පැමිණීමට අප බොහෝ සෙයින් කැමති ය. ඔහු අප හැමදෙනාට ම ඉනේ බැඳ ඇති පටියේ ඇති පොකැට්ටුවෙන් සල්ලි ගෙන සත පහ ගණනේ හෝ දහය ගණනේ දෙන බැවිනි.

"පියසේන" මම ඔහු දෙස බලමි.
"මෙහෙට වරෙන්"
මම ඔහු ළඟට යමි.
"උඹ දැන් ඉස්කොළේ කීයෙද?"
"දෙකේ"
"ආ ඉඳා විස්කිරිසද්සද කාපං"

ඔහු දෙන සතපහට විස්කිරිසද්සා හෝ ඇඟිලි විස්කෝතු දෙකක් ගත් විට සතයක් ද ඉතිරි වේ. එම සතයේ හූණුබිප්පු හෝ නාරං බීක් ගනිමි. ඉඟුරු විස්කෝතු නම් ශත පහට පහක් ගත හැකි ය.

එක දවසක් පියතිලක බාප්පාත් මාත් තේ ඉස්ටෝරුවට ගොස් සිටින විට පැමිණි ජෝන් මුදලාලි ශතදහයේ කාසි දෙකක් අප දෙදෙනා අත තැබී ය. මට ලැබුණු ශතදහයට ජයසිංහ මුදලාලිගේ කඩයෙන් විස්කිරිසද්සා පහක් මිල දී ගතිමි. ඒ ටික ඔඩොක්කුවේ දමා ගෙන තේ ඉස්ටෝරුව ළඟ නවතා තිබුණු ලොරියට අමාරුවෙන් නැග ඇතුළෙන් තට්ටුව උඩ වාඩි වී පිටුපස දොරට හේත්තු වී විස්කිරිසද්සා කෑමට පටන් ගත්තෙමි. එයින් දෙකක් පමණ කන විට ලොරිය පණ ගැන්විණි. ක්‍රමයෙන් ලොරිය පහළට ඇදුණි. මොනවා හරි පැටවීමට ලොරිය වෙනත් තැනකට ගැනීමට යයි සිතූ මා විස්කිරිසද්සා කමින් එසේ ම සිටියේ මීට පෙර ද එසේ සිදු වී ඇති බැවිනි. ලොරිය නවතින පාටක් නැති බව දැනුණු විට මම නැගිටිටෙමි. දෑං කන්නන්ගර මහතාගේ ගෙයත් පසු කොට ලොරිය යයි. ලොරිය

## නිර්මාණකරුවකුගේ මතක සටහන්

පිටුපස මා පමණ ය. මම කෑ ගැසුවෙමි. එහෙත් මගේ කෑ ගැසීම කිසිවෙකුට ඇසෙන්නේ නැත. ලොරියේ ශබ්දයටත්, ඉදිරිපසට පිටුපස නො පෙනෙන නිසා ත් මගේ කිසිම හඬක් ඉදිරියේ සිටින අයට ඇසෙන්නේ නැත. ලොරියේ ඇතුළත දුවමින්, පිටුපස දොරේ එල්ලෙමින් මම කෑ ගැසුවෙමි.

ගල්ලෙන රජමහා විහාරයත් පසුකොට ලොරිය ඉදිරියට ඇදෙයි. පාරේ සිටින කීප දෙනෙකුට අඬමින්, අතින් සන් කරමින්, දන්නා ආකාරයෙන් මා වැටී ඇති අමාරුව ගැන ඇඟවූවත්, ඔවුන් කළේ මට සැලියුට් දැමීම ය.

පන්සල් හන්දියෙන් වමට හැරුණු ලොරියේ වේගය ද වැඩි විය. වරකාගොඩ හන්දියත් පසු විය. ලොරියෙන් පැනීමට කීප වාරයක් සිතුණත්, දොරේ උසත්, හිතේ බයත් එයට ඉඩ නොදෙයි. මගේ කෑ ගැසීමේ සීමාවක් නැති වුවද එය ඇහෙන්ට කිසිවෙකු නැත. නෑබොඩ හන්දියෙන් වමට හැරවූ ලොරිය කැන්දකඩුව රෝහල පාරෙන් ඉදිරියට යමින් සෑහෙන දුරක් ගොස් නැවැත්විණි.

ලොරියේ සහායකයා "හා හරි එන්න. හරි හරි කපන්න" කියමින් ලොරිය පිටු පසට පැමිණි විට මා දුටුවේ ය. මා දෙස බලා ඔලුවට අත ගසා ගනිමින් ම ඔහු ලොරිය ඉදිරිපසට දිව්වේ ය.

"මොනව" කියමින් රියැදුරා දඬි බිඬි ගා ලොරියෙන් බසින හඬත් සමගම පිටු පසට දුවගෙන ආවේ ය.

"යකෝ මේ නෝමිස්ලෑජ ගෙදර පොඩි එකානෙ. ටිකොනිස් මාමලෑජ ගෙදර බං. කොහේ ද බොල මේ ආවේ" රියැදුරු තැන වෙවුලමින් කෑගැසුවේ ය.

> *ඔහු මාරාවේෂයෙන් සයිකලය පදියි. සයිකලයේ වේගය කන්ද පල්ලම කියා වෙනසක් නැත. කන්ද පැදගෙන යන සයිකලය පල්ලමේ නිවිටල් යයි. නිවිටල් යන විට ඔහු මගේ කන මිරිකයි.*

මට කියන්නට දෙයක් නැත. අඬනවාට වඩා යමක් කියැවෙන්නේ ද නැත.

"ඈ හල්ලො තොට බව්දි එන්න කීවෙ." ලොරි සහායකයා රියැදුරාට වඩා සරල ය. මා මහා හයියෙන් හැඬූ අතර ඔහු ලොරියේ දොර ඇර ගෙ බිමට බහින්නට සලස්වා, බිමට පැන්න විට කන අල්ලා තදින් මිරිකා සෙලෙව්වේ ය.

"මූ මේ කරපු වැඩක්. දැන් තේ නෙමෙයි ගෙනියන්න තියෙන්නේ මුගෙ ඔලුගෙඩිය." රියැදුරා දස අතේ කල්පනා කරමින් එහෙට මෙහෙට යමින් සිට එක විට ම නැවතී සහායකයාට කතා කොට පැත්තකට අඬ ගහගෙන ගොස් දෙදෙනා සමග කතා කරන්නට විය.

25 වන පිටට

කලාශූරී සනත් පියසේනයන් විසින් ලියන ලද'' පොඩි කොලුවයි ගමයි ගඟයි'' ග්‍රන්ථය ශ්‍රී ලංකා අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මගින් පාසල් පුස්තකාල පොතක් වශයෙන් අනුමත කර ඇත.මේ පොත තැපැල් මගින් ලබා ගැනීමට පහත ලිපිනයෙන් විමසන්න.
සනත් පියසේන
නො:33 ජරමන් හිත මිතු ගම මාකන්දන- -මඩපාත-ශ්‍රී ලංකාව
RES: 94-1-2702899
MO: 0776434146